(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 35.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2018 සැප්තැම්බර් 18 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

**ගරු කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

**ගරු තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

**ගරු වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

**ගරු මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

**ගරු ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

**ගරු එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධශාසන අමාත්‍යතුමා

**ගරු රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

**ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

**ගරු තිලක් මාරපන මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

**ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

**ගරු රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

**ගරු අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

**ගරු කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා

**ගරු පී. හැරිසන් මහතා,** සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා

**ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

**ගරු ජේ. සී. අලවතුවල මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු පියසේන ගමගේ මහතා,** තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු වීරකුමාර දිසානායක මහතා,** මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,** පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික සමගිය හා සහජීවනය රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා,** අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු මනූෂ නානායක්කාර මහතා,** විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු මුත්තු සිවලිංගම් මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

**ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

**ගරු රවී කරුණානායක මහතා**

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**

**ගරු වේලු කුමාර් මහතා**

**ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**

**ගරු චන්දිම ගමගේ මහතා**

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**

**ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**

**ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා**

**ගරු ඩී. වී. චානක මහතා**

**ගරු සිසිර ජයකොඩි මහතා**

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන** : කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව **'විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය'** නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් දහයක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි."

**II**

"පාර්ලිමේන්තුවේ අංක 127(3) වැනි ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලකී ජයවර්ධන මහතා ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**III**

"පාර්ලිමේන්තුවේ අංක 127(3) වැනි ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාව විසින් ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා සහ ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**IV**

"පාර්ලිමේන්තුවේ අංක 111(21) සහ (22) (අ) ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාව විසින් ගරු සන්දිත් සමරසිංහ මහතා සහ ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**V**

"පාර්ලිමේන්තුවේ අංක 111(21) සහ (22) (අ) ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාව විසින් ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සිසිර ජයකොඩි මහතා ඉවත් කොට, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කනක හේරත් මහතා එකී කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කර ඇති බව දන්වනු කැමැත්තෙමි."

**VI**

"පාර්ලිමේන්තුවේ අංක 111 (21) සහ (22) (අ) වැනි ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**VII**

"පාර්ලිමේන්තුවේ අංක 111 (21) සහ (22) (අ) ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු වේලු කුමාර් මහතා තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**VIII**

"පාර්ලිමේන්තුවේ අංක 111 (21) සහ (22) (අ) ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අරවින්ද් කුමාර් මහතා කාන්තා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**IX**

"පාර්ලිමේන්තුවේ අංක 111 (20) ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාව විසින් කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දුනේෂ් ගන්කන්ද මහතා ඉවත් කොට, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රංජිත් අලුවිහාරේ මහතා එකී කාරක සභාවේ සේවය කිරීම පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි."

**X**

"පාර්ලිමේන්තුවේ අංක 111 (20) ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාව විසින් ප්‍රතිසන්ධාන හා උතුර හා නැගෙනහිර නැවත ගොඩනැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු කේ. කාදර් මස්තාන් මහතා සහ ගරු සෙයියිඩ් අලී සාහීර් මවුලානා මහතා ඉවත් කොට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු දුනේෂ් ගන්කන්ද මහතා සහ ගරු රංජිත් අලුවිහාරේ මහතා එකී කාරක සභාවේ සේවය පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි."

**XI**

"පාර්ලිමේන්තුවේ අංක 111 (20) ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාව විසින් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රංජිත් අලුවිහාරේ මහතා ඉවත් කොට, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බුද්ධික පතිරණ මහතා එකී කාරක සභාවේ සේවය පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි."

**XII**

"පාර්ලිමේන්තුවේ අංක 112 (1) (ආ) ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලකී ජයවර්ධන මහතා, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉවත් කොට, නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි."

**XIII**

"පාර්ලිමේන්තුවේ අංක 112 ස්ථාවර නියෝගයේ විධිවිධානවල, 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාවේ තීරණය, 2018 ජූලි මස 17 වැනි දින සහ සැප්තැම්බර් 07 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව මතු සඳහන් මන්ත්‍රීවරයන්, ඒ ඒ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:-

1. **ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

   ගරු විමල් වීරවංශ මහතා මහතා

2. **මහවැලි සංවර්ධන හා පරිසර පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

   ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

3. **ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

   ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

4. **සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

   ගරු ගාමිණී ලොකුගේ මහතා

5. **ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

   ගරු තාරානාත් බස්නායක මහතා

6. **විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

   ගරු අනුරාධ ජයරත්න මහතා

7. **රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

   ගරු එස්. බී. දිසානායක මහතා

8. **විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

   ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා

9. **වරාය හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

   ගරු දයාසිරි ජයසේකර මහතා

**10.** **ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

**11.** **සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

**12.** **අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ටී. බී. ඒකනායක මහතා

**13.** **කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

**14.** **වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා

**15.** **විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

**16.** **වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

**17.** **රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

**18.** **නිවාස හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

**19.** **ඛනිජ තෙල් සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු චන්දිම වීරක්කොඩි මහතා

**20.** **කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු සී. බී. රත්නායක මහතා

**21.** **ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

**22. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

**23. අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

**24. විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් සහ විදේශ රැකියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ඩිලාන් පෙරේරා මහතා

**25. සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

**26. පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

**27. සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු තිලංග සුමතිපාල මහතා

**28. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු වාසුදේව නානායක්කාර මහතා"

**XIV**

"පාර්ලිමේන්තුවේ අංක 113 ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව නියෝජ්‍ය කථානායකවරයාගේ සභාපතිත්වයෙන් නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ද ඇතුළුව 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:-

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා"

**XV**

"පාර්ලිමේන්තුවේ අංක 126 ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයාගේ සභාපතිත්වයෙන් විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ද ඇතුළුව 2018 සැප්තැම්බර් 06 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:-

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය"

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) කථානායකවරයා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

(i) 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ VIII කොටස; සහ

(ii) 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXI කොටස, තෙවැනි කාණ්ඩයේ IX කොටස සහ නවවැනි කාණ්ඩයේ VI කොටස

පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි ද මුද්‍රණය කළ යුතු යැයිද නියෝග කරන ලදී.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2015 වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2016 වර්ෂයේ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) 2016 වර්ෂයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව

පිළිගන්වා, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු

සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2013 වර්ෂය සඳහා වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2016 වර්ෂය සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(ii) 2016 වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2016 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්;

(iv) 2016 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව;

(v) 2016 වර්ෂය සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ දොළොස් වැනි වාර්ෂික වාර්තාව;

(vi) 2016 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් වාර්තාව;

(vii) 2016 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(viii) 2016 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ, අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ, නීතිපති දෙපාර්තමේන්තුවේ, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ, ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ, මහා භාරකාර දෙපාර්තමේන්තුවේ, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ සහ ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු

ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) වගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ ආනයන හා අපනයන (පාලන) නියෝග සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අගෝස්තු 10 දිනැති අංක 2083/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම : (1)** ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු චමල් රාජපක්ෂ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

- (i) ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත;
- (ii) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග;
- (iii) 2017 වර්ෂය සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව; සහ
- (iv) 2016 වර්ෂය සඳහා ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු වඩිවේල් සුරේෂ් මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද, ශ්‍රී ලංකා සේවා පිරිස් කළමණාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) රාගම, පහළ කරගහමුණ, අංක 290/2/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ජේ. චන්දන පෙරේරා මහතාගෙන් ලැබුණු 2018.01.10 දිනැති පෙත්සම ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් පිළිගන්වන ලදී.

(2) බත්තරමුල්ල, "සුහුරුපාය", ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක (තොරතුරු තාක්ෂණ) ලෙස සේවය කරන එස්. එන්. බී. ඒ. කේ. එම්. එන්. ඩී. නාමරත්න මහත්මියගෙන් ලැබුණු 2018.08.14 දිනැති පෙත්සම ගරු එඩ්වඩ් ගුණසේකර මහතා විසින් පිළිගන්වන ලදී.

(3) නැගම්පහ, ඉදිගොල්ලෑගම, සියඹලංගමුව දකුණ, අංක 02 දරන ස්ථානයෙහි පදිංචි ඩී. එම්. ප්‍රසිලා බිසෝකුමාරිහාමි මහත්මියගෙන් ලැබුණු 2017.12.03 දිනැති පෙත්සම ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) සේරුවිල, කාවන්තිස්සපුර, අංක 218 දරන ස්ථානයෙහි පදිංචි කේ. ඒ. රූපලතා මහත්මියගෙන් ලැබුණු 2018.08.16 දිනැති පෙත්සම; සහ

(ii) සේරුනුවර, නව තිස්සපුර, අංක 165 දරන ස්ථානයෙහි පදිංචි මෙරගල්ගේ ජයරත්න මහතාගෙන් ලැබුණු 2018.07.20 දිනැති පෙත්සම

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) තලංගම උතුර, පයිප්ප පාර, කොස්වත්ත, අංක 382/1/ඩී, "මධුෂානි" යන ලිපිනයෙහි පදිංචි ඩී. ඒ. ජේ. එම්. දයානන්ද මහතාගෙන් ලැබුණු 2018.07.17 දිනැති පෙත්සම;

(ii) කළුතර දකුණ, වැලිතුඩුව වත්ත, ගමගොඩ පාර, අංක 113 දරන ස්ථානයෙහි පදිංචි එල්. පී. යූ. කරුණාරත්න මහතාගෙන් ලැබුණු 2018.07.30 දිනැති පෙත්සම;

(iii) අනුරාධපුරය, සාලියපුර, ගල්වල හන්දිය, අංක 48 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. කැලුම් චන්දන මහතාගෙන් ලැබුණු 2018.05.07 දිනැති පෙත්සම;

(iv) ගාල්ල, වලහන්දුව, මානවිල, "අජන්තා" යන ලිපිනයෙහි පදිංචි එම්. එල්. අයි. ප්‍රියංගනී මහත්මියගෙන් ලැබුණු 2018.07.04 දිනැති පෙත්සම; සහ

(v) පිළිමතලාව, ඉලුක්වත්ත, හොන්දෙණියවත්ත, අංක 134/1/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. ඉනෝකා නිලන්ති පීරිස් මහත්මියගෙන් ලැබුණු 2018.07.10 දිනැති පෙත්සම

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසින් පිළිගන්වන ලදී.

(6) මහනුවර, අරුප්පල, තාක්ෂණ විද්‍යාලයේ සේවයේ නියුතු එස්. චමලි ගුණතිලක මහත්මියගෙන් ලැබුණු 2018.07.31 දිනැති පෙත්සම ගරු සන්දිත් සමරසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය''යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(අ. භා. 2.48 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

''ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය යුතුය''යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.26 ට ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.)

''ගරු කනක හේරත් මහතා මූලාසනාරූඪ විය යුතුය''යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.19 ට ගරු කනක හේරත් මහතා මූලාසනාරූඪ විය.)

''ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය යුතුය''යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.43 ට ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය''යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

මූලාසනාරූඩ මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ වූවාය.

1 වැනි වගන්තියේ සිට 9 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

උපලේඛනය

''උපලේඛනය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පූර්විකාව

''පූර්විකාව පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය

''ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතුය''යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**6. සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග :** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 11 (1)(ආ), 17(2) සහ 31 (ඇ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 117 (2)(එ) වගන්තිය යටතේ සිවිල් ගුවන් සේවා නිරුපද්‍රිතතා කළමනාකරණ නියෝග සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 05 දිනැති අංක 2065/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.08.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. කල් තැබීම :** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය''යි, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 6.03 ට, 2018 සැප්තැම්බර් 19 වැනි බදාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.